විවිධ

# බන්ධනාගාර රැඳවියන්ට මූලික පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියක්



සිරකරු සුබසාධන සංගමය පුද්ගලික අංශයේ ව්‍යවසායකයන්ගේ සහාය ඇතිව මෙරට බන්ධනාගාරවල රැඳවියන් සඳහා වූ මූලික අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් අරඹයි. සංගමයේ සභාපති මිලින්ද මොරගොඩ මහතා පසුගියදා වැලිකඩ බන්ධනාගාරයේ පවතිනඅඩු පහසුකම් කවරේදැයි පරීක්ෂා කර බැලීමේ අවස්ථාවකට සහභාගී විය. ව්‍යාපෘති සම්බන්ධීකාරක ආර්. ඒ. ඩී. සිරිසේන, බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) ජේ. ආර්. ළමාහේවා සහ වැලිකඩ බන්ධනාගාර අධිකාරී චන්දන ඒකනායක මහත්වරු මෙම අවස්ථාවට එකතු වූ අයුරු ඡායාරූපයෙහි දැක්වෙයි. ඉදිරි මාස කිහිපය තුළ වැලිකඩ බන්ධනාගාරයේ දීර්ඝකාලීන සිර දඬුවම් ලබන අංශය වෙනුවෙන් වැසිකිළි හා කැසිකිළි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියනයක් වෙන් කිරීමට ජෝන් කීල්ස් පදනම එකඟ වී ඇති බව මිලින්ද මොරගොඩ මහතා මෙහිදී අනාවරණය කළේය.